# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.16 පැය 0620 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1896/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - දමන පොලිස් වසම.**

2025.10.15 වන දින සවස් කාලයේ දමන පොලිස් වසමේ දිවියාගල ප්‍රදේශයේදී දමන පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර පුද්ගලික ඉඩමක් තුල පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු හා සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 55 ක් හා සැකකරුවන් අවුරුදු 42 හා 65 යන වයස්වල පසුවන දිවියාගල හා මොරගහපල්ලම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

දමන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මෘත ශරීරයක් හමුවීම - දිවුලපිටිය පොලිස් වසම.**

2025.10.15 වන දින දහවල් කාලයේ දිවුලපිටිය පොලිස් වසමේ බලගල්ල ප්‍රදේශයේ පිහිටි තාවකාලික ලැගුම්හලක කාමරයක් තුළ පුද්ගලයෙකු මියගොස් ඇති බවට දිවුලපිටිය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ මහවිලච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු මෘත ශරීරය ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෘත ශරීරක් හමුවීම - මාවතගම පොලිස් වසම.**

2025.10.15 වන දින දහවල් කාලයේ මාවතගම පොලිස් වසමේ ගලපිටමුල්ල ප්‍රදේශයේ පිහිටි කොරසවැවේ සැකකටයුතු මෘත ශරීරයක් ඇති බවට මාවතගම පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 63 ක් වූ හිඳගොල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු දින කිහිපයකට පෙර අතුරුදහන්ව ඇති බවට ඥාතීන් විසින් මාවතගම පොලිස් ස්ථානයට පැමිණිල්ලක්ද සිදුකර ඇත. මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු මෘත

ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මාවතගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. හදිසි අනතුරකින් පුද්ගලයෙකු මිය යාමක් - කොලොන්න පොලිස් වසම.

2025.10.15 වන දින දහවල් කාලයේ කොලොන්න පොලිස් වසමේ ගිනිගල්ගොඩ ප්‍රදේශයේදී පුද්ගලයෙකු මතට දැව කඳක් පෙරළීමෙන් බරපතල තුවාල ලබා කොලොන්න රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට කොලොන්න පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වූ කැල්ල, කොලොන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් පුද්ගලයෙකු සමඟ බූම් ට්‍රක් රථයකට දැව කඳන් පටවමින් සිටියදී දැව කඳක් මරණකරු මතට පෙරලීමෙන් මෙම අනතුර සිදුව ඇති බවට දැනට සිදු කල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කොලොන්න රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කොලොන්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - කල්පිටිය පොලිස් වසම.

2025.10.15 වන දින සවස් කාලයේ කල්පිටිය පොලිස් වසමේ උච්චමුනිය දූපතේ මුහුදු තීරයේදී පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට කල්පිටිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 57 ක් වූ කරාපිටිය, ගාල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් මිතුරන් 05 දෙනෙකු සමඟ විනෝද චාරිකාවක් සඳහා පැමිණ මුහුදු තීරයේ දිය නාමින් සිටියදී මුහුදු රැල්ලට හසුව ගසා ගෙන ගොස් මෙම අනතුර සිදුව ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - තංගල්ල පොලිස් වසම.

2025.10.15 වන දින උදෑසන කාලයේ තංගල්ල පොලිස් වසමේ තංගල්ල ධීවර වරායේ දියේ ගිලී මියගිය පුද්ගලයෙකුගේ මෘත ශරීරයක් පාවෙමින් ඇති බවට තංගල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ දංකැටිය, තංගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු මිතුරන් කිහිපදෙනෙකු සමඟ බෝට්ටුවක් තුළ පැවැති සාදයකට සහභාගි වී සිටියදී දියට ඇද වැටී මෙලෙස මියගොස් ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු මරණය සම්බන්ධයෙන් විවෘත තීන්දුවක් ලබාදී ඇත. තංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - වරකාපොල පොලිස් වසම.

2025.10.15 වන දින සවස් කාලයේ වරකාපොල පොලිස් වසමේ අලව්ව අඹේපුස්ස මාර්ගයේ වාරියගොඩ ප්‍රදේශයේදී අඹේපුස්ස දෙස සිට අලව්ව දෙසට ධාවනය වූ යුද හමුදා කැබ් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් කැබ් රථයේ රියදුරු, යතුරුපැදිකරු, පසු පැදිකරුවෙකු හා පසු පැදිකාරියක් බරපතල තුවාල ලබා වරකාපොල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පසුපැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 17 ක් වූ කිතුලූල්ල, නව තල්වත්ත ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය වරකාපොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වරකාපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - දික්වැල්ල පොලිස් වසම.

2025.10.15 වන දින උදෑසන කාලයේ දික්වැල්ල පොලිස් වසමේ කොකාවල මාර්ගයේ දෙව්සිරිගම ප්‍රදේශයේදී ඇඟළුම් කම්හලක සේවක සේවිකාවන් රැගත් බස් රථයක් කොකාවල දෙස සිට උඩුවිල දෙසට ධාවනය කිරීමේදී මාර්ගයේ අයිනේ ගමන් ගත් පදික පුද්ගලයෙකුගේ හා කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා හා කාන්තාව බතීගම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පදික කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 51 ක් වූ කිරිහන්දෙනියවත්ත, කෝට්ටගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය බතීගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. දික්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - දොඹගහවෙල පොලිස් වසම.

2025.10.15 වන දින දහවල් කාලයේ දොඹගහවෙල පොලිස් වසමේ දොඹගහවෙල පහතඅරාව මාර්ගයේ පොල්කොටන් අරාව හන්දියේදී දොඹගහවෙල දෙස සිට පහතඅරාව දෙසට ධාවනය වූ යතුරුපැදියක් විරුද්ධ දෙසින් පැමිණි ටිපර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු සියඹලාණ්ඩුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ දොඹගහවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සියඹලාණ්ඩුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් ටිපර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. දොඹගහවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - පොළොන්නරුව පොලිස් වසම.

2025.10.15 වන දින රාත්‍රී කාලයේ පොළොන්නරුව පොලිස් වසමේ වලේකඩේ ඕනෑගම මාර්ගයේ කිලෝමීටර් 09 කණුව ආසන්නයේදී ඕනෑගම දෙස සිට වලේකඩේ දෙසට ධාවනය වූ යතුරුපැදියක් විරුද්ධ දෙසින් පැමිණි තවත් යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරුවන් දෙදෙනා පොළොන්නරුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් පැදිකරුවෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වූ පොළොන්නරුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් පොළොන්නරුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**